රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 05/97 (VII)-2004

මගේ අංකය : ආ/7/4/1/2
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2004.08.19 වැනි දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය නිලධාරීන් සඳහා වන රක්ෂණ ක්‍රමය (අග්‍රහාර)

2004 වසර සඳහා පහත සඳහන් සංශෝධන සහිතව අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

I බාහිර ප්‍රතිකාර සහ ඇස් කණ්ණාඩි සඳහා වියදම් ප්‍රතිපූර්ණය ඉවත් කිරීම

II අවිවාහක නිලධාරීන්ගේ දෙමාපියන් පමණක් යැපෙන්නන් ලෙස සලකනු ලබන අතර, සහෝදර සහෝදරියන් ඉවත් කිරීම


02. ඉහත දැක්වෙන සංශෝධන ද සැලකිල්ලට ගනිමින් 2004 වසර සඳහා හිමිකම් ඉල්ලීම් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ඉදිරිපත් කළයුතු අතර, පහත සඳහන් උපදෙස් අනුගමනය කළයුතුය.

2.1 2004 ජනවාරි මස 01 වැනි දින සිට ජූලි මස 31 වැනි දින දක්වා කාල සීමාවට අදල හිමිකම් ඉල්ලීම් 2004 ඔක්තෝබර් මස 01 වැනි දිනට හෝ ඊට පෙර සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ඉදිරිපත් කළයුතුය.

2.2 2004 අගෝස්තු මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාල සීමාවට අදල හිමිකම් ඉල්ලීම් එම ඉල්ලීම පැන නැගුන දින සිට දින 90 ක් ඇතුලත සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ඉදිරිපත් කළයුතුය.

2.3 හිමිකම් ඉල්ලීම්වල සත්‍යබව සහ නිවැරදි බව පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසුව පමණක් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ඉදිරිපත් කළයුතුය.

03. 2005 වසරේ සිට රක්ෂිතයන්ට වැඩි ප්‍රතිලාභ ලැබෙන පරිදි රක්ෂණ යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා කරුණු සලකා බැලීමට නිලධාරී කමිටුවක් පත් කරනු ලැබ ඇත. ඒ පිළිබඳව වැඩිදුර තොරතුරු යථා කාලයේ දී ඔබ වෙත දන්වනු ලැබේ.



එස්.සී. මාන්නප්පෙරුම
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය